වී. සුකේයෙවී

දඟකාර පූසා

වී. සුකේයෙවී

දහකාර පූසා

අනුවාදය

පද්ම හර්ෂ කුරණගේ

Kanol

දඟකාර පූසා

කතාව සහ චිත්‍ර
වී. සුතේයෙව්

අනුවාදය
පද්ම හර්ෂ කුරණගේ

නව සකැසුම
මාලක ලලනජීව

ISBN 978-955-1979-39-3

ප්‍රකාශනය

කැනොල් පබ්ලිෂිං හවුස්

මුද්‍රණය
යස ඉසුරු ප්‍රින්ටර්ස්

ප්‍රථම මුද්‍රණය 2013

පුංචි ගෑනු ළමයා මේසය ළඟ වාඩි වී පින්තූර අඳිනවා. වයිරන් පූසා පුටු ඇන්දට පැනල ඇය අඳින දිහා බලා ගෙන ඉන්න වුණා.

"මොනවද ඔයා කරන්නේ?" පූසා විපරම්කාරීව ඇහුවා.

"මම උඹට ගෙයක් අඳිනවා." පුංචි ගෑනු ළමයා කීවා. "බලන්න මේ වහල, මේ දුම් කවුළුව, මේ තමා දොර...."

"ඉතින් මම මොනවද ගෙදර කරන්නෙ?"

"උඹට පුළුවන් බත් උයන්න."



පුංචි ගෑනු ළමයා දුම් කවුළුවෙන් දුම් පිට වෙනවා ඇන්දා.

"ඉතින් කෝ ජනේල?" පූසා ඇහුවා. "ඔයා දන්නවනේ, පූසෝ හැම තිස්සෙම ජනේලවලින් පැනල යන්නෙ!"

"මෙන්න තියෙනවා - එකයි, දෙකයි, තුනයි, හතරයි..." ඈ ඇන්දා කුඩා ජනේල හතරක්.

"ඉතින් මට ඇවිදින්න තැනක් හෙම තියෙනව ද?"



"මෙන්න තියෙනවා"

පුංචි ගෑනු ළමයා ඇන්දා ගේ වටේට වැටක්.

"ඒක උයන" ඈ කිව්වා.

පූසා ඉව කළා

"අපෝ ඒක උයනක් යැ?" ඈ කීවා. "ඒකෙ මොකුත් නෑ නේ!"



"පොඩියක් ඉඳින් පූසො" පුංචි ගෑනු ළමයා කීවා. "මෙන්න උඹට මල්පාත්තියක් තියෙනවා. මෙන්න ඇපලුත් එක්ක ඇපල් ගහක්. තව එළවළු කොටුවක්, ඒකෙ කැරටුයි ගෝවයි තියෙනවා..."

"ගෝවා!" නහය හකුළමින් පූසා කීවා. "ඉතින් මම කොහෙන් ද මාළු අල්ලන්නෙ?"



"මෙන්න තියෙනවා"

පුංචි ගෑනු ළමයා පොකුණක් ඇන්දා. පස්සෙ පොකුණෙ මාළු පිහිනව ඇන්දා.

"ඒක අපූරුයි... ඉතින් කුරුල්ලො හෙම නැද්ද?" පූසා විපරමිකාරීව ඇහුවා.

"මම කුරුල්ලන්ට ආදරයෙ"



"ආ, ඔව්. මෙන්න කුකුළෙකුයි, කිකිළියෙකුයි. මෙන්න පාත්තයෙක්. තව කුකුල් පැටව් තුන් දෙනෙක්..."

පූසා හකුපාඩා ලෙවකාලා පුරු පුරු ගෑවා. පස්සෙ හීන් හඬකින් අහනවා මෙහෙම:

"ඉතින්.... ගෙදර මීයො එහෙම නැද්ද."

"නෑ. මීයො ඕන නෑ ගෙදරට"

"ඉතින් කවුද මගේ ගේ බලා කියා ගන්නෙ?"

"එය බලා කියා ගන්න...." පුංචි ගෑනු ළමයා බලු කුඩුවක් ඇන්දා. "මෙන්න උඹේ මුරකාරයා, එයාගෙ නම රෝවර්!"

පූසා වල්ගය නැටෙව්වා, උගේ මයිල් කෙළින් හිටියා.

"මම ඔයාගෙ ගෙට පොඩියක්වත් කැමති නෑ. මම ඒකෙ ඉන්න කැමති නෑ!" පූසා කීවා.

එහෙම කියල ඌ කේන්තියෙන් යන්න ගියා.

ඌ දඟකාර පූසෙක් නේ ද?



Kanol

Kanol Publishing House
1196/4, Kottawa Road, Pannipitiya
Tel: 011 4336778, 071 3493447
kanolpublish@gmail.com

ISBN 978-955-1979-08-9
Rs. 80/-
9 789551 979089